**සීමාසහිත කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම - 2022**
---------------------------------------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මූල්‍ය ප්රකාශන විගණය සඳහා විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධවයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම 2015 පෙබරවාරි 18 දින සිට වසර 20 ක කාලයක් සඳහා කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම, හිමිකාරිත්වය දැරීමට සහ පවත්වාගෙන යාම සඳහා ඉඩමක් බදු පදනම මත ලබා ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, SLFRS 16 - කල්බදු ප්‍රමිතය ප්‍රකාරව වත්කම් භාවිතා කිරීමේ අයිතිය, කල්බදු වගකීම සහ බලපත්‍ර ගාස්තු මත බදු ගෙවීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | සියලුම මිනි හයිඩ්‍රො බලශක්ති සංවර්ධකයින් සඳහා ලබා දී ඇති සහනය අනුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම් බදු දීම සඳහා විශේෂිත සහනය ලබා ගැනීමට සහ මූල්‍ය සංශෝධනය කිරීමට සමාගම ක්‍රියා කරනු ඇත. SLFRS 16 මත පදනම්ව සමාගම යෝජිත සංශෝධනවලට අනුගත වනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට අනුකූල විය යුතුය. |
| (ආ) | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 08 ) 42 (අ) සහ (ආ) ඡේදයට අනුව, 2019 වසරේ සිට 2021 වසර දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට (BOI) ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන 4.6 ක් සමාගම විසින් පූර්ව වර්ෂයේ ගැලපීම් ලෙස හඳුනානොගෙන 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 ඔක්තෝම්බර් 05 දින දැනුම්දීම මත පදනම්ව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා වාර්ෂික ගාස්තුව නිශ්චිත වර්ෂය අනුව වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර, වර්ෂය අනුව හඳුනා ගත් වියදම් සඳහා මේ වන විටත් ගැලපීම් සිදු කර ඇත. | -එම- |
| (ඇ) | දේපල පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 16) 51 ඡේදය ප්‍රකාරව, රු.564,060 ක් සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට සමාගම විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | සමාගම විසින් ඉදිරියෙදි ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියට අනුගත වනු ඇත. | -එම- |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, **2017** සිට **2022** දක්වා කාලය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට **2022** දෙසැම්බර් **31** දිනට ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන **24.38** ක් වූ අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු මත විගණනය මගින් වාර්ෂික ගාස්තු (වැට් බද්ද සමඟ) ගණනය කිරීම අනුව, එම ශේෂය දළ වශයෙන් රු. මිලියන **25.71** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සහ විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම් අතර ගෙවිය යුතු වාර්ෂික ගාස්තුවේ රු.මිලියන **1.31** ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස පරීක්ෂා කර ඒ අනුව සකස් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගයන් සටහන් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ **2022** ජනවාරි **10** දිනැති ලිපියට අනුව, වාර්ෂික ගාස්තුව නොගෙවීම හේතුවෙන් **2017** සිට **2021** දක්වා කාලය සඳහා රු.මිලියන **1.78** ක වාර්ෂික ගාස්තු සඳහා කල් ඉකුත් වූ පොලියක් දෙපාර්තමේන්තුව විසින් අය කර ඇත. කෙසේ වෙතත්, එය සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හෝ අනාවරණය කිරීම සිදු කර නොතිබුණි. | නිවැරදි වටිනාකම උපචිත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු නිසි ලෙස සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, **2022** දෙසැම්බර් **31** දිනට (**BOI**) වෙත ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව රු.මිලියන **10.52** ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ශේෂය පියවීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.තවද, **BOI** විසින් **2022** ඔක්තෝම්බර් **05** දිනැති ලිපිය මඟින් හිඟ මුදල් සම්බන්ධව දක්වා ඇති තොරතුරු අනුව, **2018** සිට **2022** දක්වා කාලය සඳහා කල් ඉකුත් වූ පොලිය දළ වශයෙන් රු.මිලියන **11.73** කි.කෙසේ වෙතත්, සමාගම මූල්‍ය ප්‍රකාශනවල මෙම කල් ඉකුත් වූ පොලිය හඳුනා ගැනීම හෝ හෙළිදරව් කිරීම කර නොතිබුණි. | බලශක්ති සැපයුම සඳහා ලංවිම වෙතින් ලැබිය යුතු මුදල් නොලැබීම හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ ගාස්තු පියවීමට සමාගම සතුව යහපත් මූල්‍ය තත්වයක් නොපවතී. දැනට සමාගම මෙම දඩ පොලී ගාස්තු අඩු කිරීම සඳහා **BOI** සමඟ සාකච්ඡා කරමින් සිටින අතර, ගැටලුව සම්පූර්ණයෙන් විසඳන තුරු එම පොලිය ගිණුමට උපචිත කෙරේ. | නියමිත ශේෂයන් පියවීමට සහ මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු නිසි ලෙස සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 126 වන වගන්තිය | නිසි පරිදි සම්පූර්ණ කරන ලද බදු වාර්තා සහ උපලේඛන සමඟ වෙනත් අවශ්‍ය ලියකියවිලි තක්සේරු වර්ෂය අවසානයේ නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම 2017/2018 තක්සේරු වර්ෂය සඳහා වාර්තා ගොනු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විගණකවරුන් විසින් සහතික කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් ඉල්ලා සිටි නිසා 2017/18 වර්ෂය පොරොත්තු විය. නමුත් සමාගම සතුව මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් පමණක් තිබූ බැවින් හැකි විගස මෙය සම්පූර්ණ කරනු ලැබේ. | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමේ I කොටසෙහි (14) (ආ) වගන්තිය | මූල්‍ය කාල සීමාව අවසානයේ සිට මාස හයක් ඇතුළත මූල්‍ය වර්ෂය තුළ තීරුබදු රහිත පදනම මත ව්‍යවසාය විසින් ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ පිළිබඳ භෞතික සත්‍යාපනයක ප්‍රතිඵල දැක්වෙන වාර්තාවක් ඇතුළු ගිණුම් ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන ව්‍යවසාය විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් ගිවිසුමේ අවශ්‍යතාවලට අනුකූල වී නොතිබුණි. | මෙම වගන්තිය සටහන් කර ගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරනු ඇත. | BOI ගිවිසුමේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 3.5 ක ලාභයක් වූ අතර, ඊට අනුරූප පෙර වසරේ ලාභය රු.මිලියන 38.9 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 35.4 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මූල්‍ය වියදම් සහ පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 99.9 කින් සහ සියයට 84 කින් ඉහළ යාම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම/වියදම | 2022<br>රු. | 2021<br>රු. | ඉහලයාම / (පහලයාම)<br>රු. | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ආදායම | 109,203,318 | 116,107,930 | (6,904,612) | (5.94) |
| විකුණුම් පිරිවැය | 37,607,747 | 42,502,230 | (4,894,483) | (11.51) |
| පරිපාලන වියදම් | 14,845,434 | 8,058,091 | 6,787,343 | 84.23 |
| මූල්‍ය වියදම් | 53,242,294 | 26,622,950 | 26,619,344 | 99.98 |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල අංක 2.3 වගන්ති ප්‍රකාරව උප සමාගම් විසින් ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම මව් සමාගමට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කර මව් සමාගම වන ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම නිම වෙමින් පවතී. සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම 2022 වසර සඳහා අයවැය සකස් කරනු ලැබූ අතර එහිදී මව් ආයතනය සහ සීමාසහිත කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම එකම අයවැයේ කොටසක් වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූල විය යුතුය. |